# කැලණිය විශ්වවිද්‍යාලය
## මානවශාස්ත්‍ර පීඨය
## පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

# බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව
## 2019 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම පිණිස 2019.06.23 වන දින සිට 2019.07.25 වන දින දක්වා අයදුම්පත් නිකුත් කෙරේ.

මෙම පාඨමාලාව බෞද්ධ මනෝවිද්‍යාව, බෞද්ධ මනෝ උපදේශනය හා බෞද්ධ මනෝචිකිත්සාව පිළිබඳ පූර්ණ අවබෝධයක් හා පුහුණුවක් ලබාදීමේ අරමුණින් මෙරට ප්‍රමුඛ පෙළේ ජාතික විශ්වවිද්‍යාලයක් වන කැලණිය විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය මගින් මෙහෙයවනු ලබන සුවිශේෂී ඩිප්ලෝමා පාඨමාලාවකි.

වර්තමානය වන විට බෞද්ධ මනෝවිද්‍යාව හා බෞද්ධ මනෝ උපදේශනය පිළිබඳ අධ්‍යයනය සඳහා පෙර-අපර දෙදිගම විද්වතුන් තුළ දැඩි උද්‍යෝගයක් දැකගත හැකිය. එසේ ම ඒ පිළිබඳ විශිෂ්ට මට්ටමේ පර්යේෂණයන් ද ක්‍රියාත්මක වනු දැකිය හැකිය. එවන් පසුබිමක ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මෙම විෂය ක්ෂේත්‍රය ආවරණය වන ආකාරයේ පාඨමාලා ක්‍රියාත්මක නොවීම විශාල අඩුවක්ව පැවතුණි. මෙම කාලීන අධ්‍යයන අවශ්‍යතාව සපුරාලනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලය ඒ සඳහා කඩිනමින් සුවිශේෂී පාඨමාලා කිහිපයක් ම හඳුන්වා දීමට පියවර ගෙන තිබේ.

ඒ අනුව අභ්‍යන්තර සිසුන් වෙනුවෙන් 2018 වසරේ සිට උපාධි පාඨමාලා සඳහා බෞද්ධ මනෝවිද්‍යාව විෂය හඳුන්වා දෙන ලද අතර, විශ්වවිද්‍යාල වරම් නොලැබූ එහෙත් ඒ පිළිබඳ විශේෂ උනන්දුවක් ඇති මනෝ උපදේශකවරුන්, විද්‍යාර්ථීන්, වෘත්තිකයින්, පාසල් ගුරුවරුන්, හෙද-හෙදියන්, පොලිස් නිලධාරීන් හා කළමනාකරුවන් මෙන් ම බුදුසමය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයට කැමති ඕනෑම අයෙකුට ගැලපෙන පරිදි සැකසූ සති අන්ත පාඨමාලාවක් වශයෙන් බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වා දී ඇත. 2017 වසරේ දී හා 2018 වර්ෂයේ දී එහි පළමු හා දෙවන කණ්ඩායම් ඉතා සාර්ථකව සිය පාඨමාලා අවසන් කළ අතර, 2019 අගෝස්තු මාසයේ සිට එහි තෙවන කණ්ඩායමේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

### පාඨමාලා කාලය:

පාඨමාලා කාලය වර්ෂ එකකි. (2019 අගෝස්තු මාසයේ සිට සෑම සතියක ම ඉරිදා දිනවල පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා කැලණිය විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යනාංශ පරිශ්‍රයේදී මෙම පාඨමාලාව සඳහා නියමිත දේශන පැවැත් වේ.)

**මාධ්‍යය:** සිංහල

**පාඨමාලා ගාස්තු :**

මෙම පාඨමාලාවේ සම්පූර්ණ ගාස්තුව රු. 45000/- කි. (රුපියල් හතළිස් පන් දහසකි ). පාඨමාලා ගාස්තුව වාරික තුනකින් ගෙවිය හැකිය. (පළමු වාරිකය රු.20000, දෙවන වාරිකය රු.15000, සහ තුන්වන වාරිකය රු.10000 වශයෙනි.)

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම් :**

මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අවම වශයෙන් අ.පො.ස (උ/පෙළ) විෂයයන් 3 කින් සමත් වීම **හෝ** ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත් වීම **හෝ** ධර්මාචාර්ය විභාග පරීක්ෂණය සමත් වී තිබීම සහ කැලණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් අදාළ වේ.

**අයදුම්පත් හා අයදුම් කරන ආකාරය :**

https://hu.kln.ac.lk/depts/pali/images/pdf_2018/pbapplication_dbpcnew.pdf හා https://hu.kln.ac.lk/depts/pali/ යන වෙබ් අඩවිවලින් මෙම පාඨමාලාවට ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය ලබා ගත හැකිය. වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම්පත් තැපැල් මගින් යොමු කිරීමේදී **"බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2019 අයදුම්පත්‍ර ගාස්තුව"** යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ **055-1001-8-0669229** අංක දරන ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.**750/-**ක් ගෙවා ලබාගත් රිසිට්පත, සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අමුණා එවිය යුතු වේ.

මුදල් ගෙවූ අදාළ බැංකු රිසිට්පත සමග ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ලියන ලද **රු.10/-**ක් වටිනා මුද්දර ඇල වූ "9x4" ප්‍රමාණයේ ලියුම් කවරයක්, **සම්බන්ධීකාරක, බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට එවීමෙන් තැපැල් මගින් ද අයදුම්පත් ලබාගත හැකිය. (තැපැල් මගින් අයදුම්පත් ඉල්ලුම් කිරීමේ දී ඉල්ලුම් කරන කවරයේ වම් කෙළවරේ **"බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2019 අයදුම්පත් ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය)

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.07.25 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ වම් කෙළවරේ **"බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සළකන්න.

**විමසීම්**

0112 903731/ 071 8134557

ලේඛකාධිකාරී.
කැලණිය විශ්වවිද්‍යාලය
2019.06.19